මාධ්‍ය නිවේදනය
ஊடக வெளியீடு
PRESS RELEASE

Tel : 011 2 386572 Fax : 011 2 333717
ජනාධිපති මාධ්‍ය අංශය,ජනාධිපති කාර්යාලය,කොළඹ 01
ஜனாதிபதி ஊடகப் பிரிவு, ஜனாதிபதி அலுவலகம், கொழும்பு 01
President's Media Division, President's Office, Colombo 01

නිවේදන අංක - 26
2020-03-31 ප.ව 5.25 ට

# COVID 19 සෞඛ්‍ය හා සමාජ සංරක්ෂණ අරමුදලේ තැන්පත් ශේෂය ඉහළට ...

ආයතනිකව හා පෞද්ගලිකව ලැබෙන පරිත්‍යාග සහ සෘජු තැන්පතු සමඟ COVID 19 සෞඛ්‍ය හා සමාජ සංරක්ෂණ අරමුදලේ ශේෂය රුපියල් මිලියන 242 ඉක්මවයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් සෞඛ්‍ය හා සමාජ සංරක්ෂණ අරමුදල මාර්තු මස 23 වන දින ස්ථාපනය කෙරිණි.

බැංකුව වෙත කෙරුණු රුපියල් මිලියන 9.5 ක සෘජු තැන්පත් කිරීම් සහ ජනාධිපති ලේකම් කාර්යාලය පරිත්‍යාග කළ රුපියල් ලක්ෂ 05 ක් සමගින් අද පෙ.ව 8.00 වන විට රුපියල් මිලියන 145ක් අරමුදල වෙත බැර වී තිබිණ.

මහජන බැංකුවේ මූල්‍ය කළමනාකරණ ගිණුම් දෙපාර්තමේන්තුව රුපියල් මිලියන 10ක්, මහජන බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය රුපියල් මිලියන 03ක්, පීපල් ලීසිං, ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ ලංකා බැංකුව රුපියල් මිලියන 05 බැගින් ද ජාතික ඉතිරි කිරීමේ බැංකුව රුපියල් මිලියන 08ක් සහ අක්බාර් බ්‍රදසර්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය පරිත්‍යාග කළ රුපියල් මිලියන 50 සමගින් තැන්පතුවේ ශේෂය රුපියල් මිලියන 242 දක්වා ඉහළ ගොස් තිබිණ.

ලංකා බැංකුවේ ආයතන ශාඛාවේ අංක 85737373 දරණ COVID-19 සෞඛ්‍ය හා සමාජ සංරක්ෂණ අරමුදලට දෙස් විදෙස් ඕනෑම අයෙකුට පරිත්‍යාග හෝ සෘජු තැන්පත් කිරීම් හෝ සිදු කල හැක. නීත්‍යානුකූල ගිණුම් මගින් අරමුදලට කෙරෙන පරිත්‍යාග මුදල් බදු සහ විදේශ විනිමය රෙගුලාසිවලින් නිදහස් කෙරේ. චෙක්පත් හෝ ටෙලි ග්‍රාෆ් සම්ප්‍රේෂණ මගින් ද මුදල් තැන්පත් කිරීමට පිළිවන.

0112354354 ඔස්සේ අධ්‍යක්ෂ ජනරාල් (පාලන) කේ.බී. එගොඩවෙලේ මහතා ඇමතීමෙන් මේ පිළිබඳ වැඩි විස්තර දැන ගැනීමට ද හැකි වේ.

මොහාන් කරුණාරත්න
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ජනාධිපති මාධ්‍ය අංශය

**2020-03-31**

**News Bar** සඳහා
COVID-19 සෞඛ්‍ය හා සමාජ සංරක්ෂණ අරමුදල - ආයතන ශාඛව - ලංකා බැංකුව- ගිණුම් අංක 85737373 දරණ ගිණුමට මුදල් තැන්පත් කිරීමෙන් හෝ පරිත්‍යාග වශයෙන් හෝ කොරෝනා මර්දන වැඩසටහනට ඔබට දායක විය හැක. විමසීම් - දු.ක 0112354354 ඔස්සේ කේ.බී. එගොඩවෙලේ මහතා, අධ්‍යක්ෂ ජනරාල් (පාලන) ඇමතීමෙන් ලබා ගත හැක.